**නාරම්මල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 20 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.75,000 ක් වූ වැලිකුඹුරවත්ත ඉඩමෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දෙවරක් සටහන්වීම හේතුවෙන් ඉඩම් වල අගය රු. 75,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කර ගිණුමට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රු. 2,082,100 ක ඉඩම් වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කර ගිණුමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | රු. 126,500 ක් වටිනා හීරෝ වර්ගයේ යතුරු පැදියේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛණ වල දැක්වෙන ශේෂයන් අතර රු.1,124,926 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රු.9,760,004 ක ගිණුම් විෂයයන් 02 ක් සඳහා ඔප්පු, පැවරුම් නියෝග, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | 2019 වර්ෂයේදී සමීක්ෂණය කිරීමට කටයුතු කරන අතර 2019 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීම සඳහා එම ලේඛන සියල්ල සකස් කරමින් පවතී. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| (i) | රීති 206 | වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා පිටපත් විගණනයට ලබා දීමට කටයුතු කරමි. |
| (ii) | රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණ සිදු කර නොතිබුණි. | ඉඩම් සමීක්ෂණයක් සිදුකර ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර තොරතුරු ලබා ගනිමින් සිටින අතර ඉදිරි වසරේ සිට වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 | වර්ෂ 2 ක කාලය ඉක්මවූ රු. 2,031,876 ක් වටිනා තැන්පතු 214 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | නාරම්මල නව වෙළද සංකීර්ණය, නාරම්මල පොදු වෙළද සංකීර්ණයේ හා නාරම්මල පැරණි වෙළද සංකීර්ණයේ කඩ කාමර වල ගිවිසුම් හා ආරක්ෂිත ඇප තැන්පත් වල වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු පවතින නමුත් එකම වෙළදුන් එම කඩ කාමර දිගින් දිගටම බදුගෙන ඇති බැවින් මෙම තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට නොහැකි බව සඳහන් කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/ 2002/ 2 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වේ. | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු .25,146,518 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 32,882,207 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කළ ආදායම් | 2018 රැස්කළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| --------------- | | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . |
| I. | වරිපනම් හා බදු | 8,443 | 12,536 | 12,022 | 2,402 | 5,956 | 5,010 | 4,617 | 1,739 |
| II. | කුලී | 25,430 | 24,227 | 24,166 | 145 | 21,792 | 22,307 | 22,448 | 101 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,311 | 1,013 | 1,013 | - | 2,151 | 2,355 | 2,355 | - |
| IV. | වෙනත් ආදායම් | 75,841 | 80,785 | 116,734 | 32,465 | 72,815 | 79,641 | 79,577 | 17,423 |
| එකතුව | | 111,025 | 118,561 | 153,935 | 35,012 | 102,714 | 109,313 | 108,997 | 19,263 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති රු. 2,240,292 ක මුදලින් 2019 අප්‍රේල් 30 දින වන විට තවදුරටත් රු.1,207,616 ක මුදලක් අය වීමට පැවතුණි. | තව දුරටත් හිඟව පවතින වරිපනම් හා අක්කර බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් හා බදු හිගයෙන් 2019 අප්‍රේල් 30 දිනට රු. 1,032,676 ක මුදලක් අය කර ගෙන ඇත. |

## 2.2.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 ලැබිය යුතු උසාවි දඩ රු.7,140,026 ක් හා මුද්දර ගාස්තු රු. 24, 680, 039 ක් විය. | තව දුරටත් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් මේ වන විට රු. 2,464,427 ක් ලැබී ඇති බව දන්වමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 04 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | සභාව විසින් ඉටු කළ යුතු කර්තව්‍යයන් නිවැරදිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු වේ. | සභාව විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සියල්ල ඇතුලත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කර ඇති බව දන්විමි. |

#### (ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 2,330,807 ක් වැයකර ඉදිකර තිබූ නාරම්මල මහජන බැංකුව අසල වැසිකිලිය ඉදිකිරීමේ දුර්වලතාවයක් හේතුවෙන් නිරන්තරයෙන් උතුරා යාම නිසා වැසිකිලි වලෙහි ජලය නිතර ඉවත්කිරීමට සිදු වී තිබීමෙන් 2017 සහ 2018 වර්ෂ වල අවස්ථා 7 කදී රු.108,410 ක් වැයකර තිබුණි. නමුත් මෙම තත්වය යථා තත්ත්වයට පත් නොකර 2018 සැප්තැම්බර් සභා තීරණයක් මගින් ගලි බවුසරයක් මිල දී ගැනීමට යොජනා කර තිබුණි. | සිදුවී ඇති පාරිසරික ගැටළු අවම කර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. | මෙම කාර්යය සඳහා පළාත් පාලන ඉංජිනේරුතුමියට මේ පිළිබඳව දන්වා උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට පියවර ගෙන ඇති අතර මේ වන විට ලිපියක් පළාත් පාලන ඉංජිනේරුතුමිය වෙත යොමු කිරීමෙන් අනතුරුව දැනට මුහුණ සේදීමට ඇති බේසම් වල ජලය වැසිකිළි වලට නොයන ලෙසට සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂයක කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු රු. 7,045,594 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂයක කාලයක් ඉක්මවූ තැන්පත් වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාථමික අංශයේ තනතුරු 06 කට අදාළව සේවකයින් 12 ක් හා තනතුරු 06 කට අදාළව අනියම් සේවකයින් 11 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි. | අතිරික්ත සේවකයින් විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 25/2014 යටතේ ස්ථිර කරන ලද කණිෂ්ඨ සේවයේ තනතුරු අතරින් තනතුරු 06 කට අදාළව අනියම් සේවකයින් 11 දෙනෙකු බඳවා ගෙන ඇති අතර අනුමැතිය සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඔලියාදෙණිය සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සහ ආදාහනාගාරය පවතින ඉඩමත්, දැලිකණු අංග මාතෘ සායන මධ්‍යස්ථානයේ ඉඩමත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැලිකණුඅංග සායන මධ්‍යස්ථානය පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර ඔලියාදෙණිය ආදාහනාගාරය පවතින ඉඩම සීමා සහිත වැවිලි සමාගමට අයත් ඉඩමක් බැවින් මේ වන විට එයද පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**-----------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති බව දන්වමි. |